සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාතර්මේන්තුව
சப்ரகமுவ மாகாண கல்வி திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

| | |
|---|---|
| අනාවරණ පරීක්ෂණය | පැය 02 යි |
| கண்டுபிடிப்பு சோதனை | 02 மணி நேரம் |
| Diagnostic Test | 02 Hour |

| | |
|---|---|
| සිංහල භාෂාව හා සාහිත්‍යය | 10 ශ්‍රේණිය |
| சிங்கள மொழி மற்றும் இலக்கியம் | தரம் 10 |
| Sinhala language and literature | Grade 10 |

- උපදෙස් :- සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු 80ක් හිමිවේ.

(01) I සිට X තෙක් ඇති සියලුම අනු කොටස් වලට කෙටි උත්තර ලියන්න.

I) සිංහල අක්ෂර මාලාවේ ඇතුළත්,

(අ) ඌෂ්මාක්ෂරයක් ලියන්න (ආ) අන්තඃස්ථාක්‍ෂරයක් ලියන්න

II) පහත සඳහන් වචනවල අර්ථය පැහැදිලි වන සේ වාක්‍ය 02 ක් තනන්න.

(අ) පැල (ආ) පැළ

III) පහත සඳහන් නාම පදවල ප්‍රකෘති වෙන් කරන්න.

(අ) මහල්ලෝ (ආ) ග්‍රන්ථය

IV) පහත සඳහන් පදවල විරුද්ධ පද ලියන්න.

(අ) ආගන්තුක (ආ) ජනශූන්‍ය

V) පහත සඳහන් වාක්‍යයෙහි වචන 02 ක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන 02 ක පමණක් නිදොස් කොට ලියන්න.

(අ) තමාගේ සිත සසළ කළ අත්දැකීමක් අන්‍යයන්ට ප්‍රකාශ කිරීම නිර්මාණකරුවෙකුගේ අභිලාසය යි.

VI) පහත රූඩියෙන් හා ප්‍රස්තාව පිරුළෙන් අදහස් වන අර්ථය ලියන්න.

(අ) හමස් පෙට්ටියට යාම (ආ) ඌරෝ කවදා ද කහ කෑවේ

VII) පහත දැක්වෙන වාක්‍යය කර්මකාරකයට හරවා ලියන්න.

(අ) ගොවියා හේනට වදින ඌරන් පන්නා දැමුවේ ය.

(ආ) ගුරුවරු දක්ෂ ශිෂ්‍යයන් අගය කරති.

VIII) පහත මොණරාගල ප්‍රාදේශීය ව්‍යවහාරයන් සඳහා භාවිත වන පොදු ව්‍යවහාර ලියන්න.

(අ) කුදහච්චා　　　　(ආ) අඹ

IX) තද කළු අකුරින් දක්වා ඇති පදවල ක්‍රියා වර්ගය දක්වන්න.

(අ) මල්ලී සෙල්ලම් කර ගෙදරට ආවේය.　　　　(ආ) අම්මා අක්කා ලවා මිදුල පිරිසිදු කරවයි.

X) පහත වචනවල අර්ථය ලියන්න.

(අ) පටිමාසර　　　　(ආ) හත්රීපාකාර

(ලකුණු 2 ං 10 ු 20)

**(02) පහත දැක්වෙන අ, ආ, ඉ, ඊ යන විස්තර අතරින් එකක් තෝරා ගෙන වචන 250 ක ට නොඅඩු රචනයක් ලියන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න.**

(අ) කොවිඩ් වෛරසය ලොව පුරා ව්‍යාප්ත වී හමාරය. මෙයින් බිළිගත් මිනිස් ජීවිත ද බොහෝය. මේ තුළින් ලෝකයේ ආර්ථික පරිහානිය ද, සමාජ ගැටලු ද බොහෝ සේ පැන නැඟී ඇත. මෙම ගැටලුවට විසඳුම් සෙවීම සඳහා සමස්ත ලෝකයම ඒකරාශී වී ඇත. කිසිම තරාතිරමකින් තොරව ජීවිත බිළිගන්නා මෙම වෛරසයෙන් බේරීමට නම් නිවැරදි සෞඛ්‍ය පුරුදු අනුගමනය කළ යුතු ය. නැතහොත් අනාගතයේ දී මුළු මහත් ලෝක ප්‍රජාවම ආගාධයකට වැටෙනු වැළැක්විය නොහැක.

(ලකුණු 25)

(ආ) වර්තමානය තුළ ක්‍රියාත්මක මාර්ගගත අධ්‍යාපනය ශ්‍රී ලංකාව තුළ ද ව්‍යාප්ත වී හමාර ය. මෙහිදී ජංගම දුරකථනය හා පරිගණක භාවිතය සාමාන්‍යකරණය වී ශිෂ්‍යයා අතට ද පත්වී එය අත්‍යවශ්‍ය භාණ්ඩයක් වී ඇත. මෙම නව විපර්යාසය හමුවේ මෙවැනි නව තාක්‍ෂණික මෙවලම් අධ්‍යාපන කාර්යය පහසු කිරීමේ ලා මහෝපකාරී වේ. එහෙත් එයින් අනිසි ප්‍රයොජ් න ගන්නා අවස්ථාවන් පිළිබඳවත්, එයින් නිසි ප්‍රයෝජන ගැනීමට දරුවන්ට නොහැකි වන නොයෙකුත් ගැටලුකාරී තත්වයන් පිළිබඳව ද නිතර අසන්නට ලැබේ.

(ලකුණු 25)

(ඉ) වර්තමාන ශ්‍රී ලාංකිකයන් වැඩි දෙනෙකුගේ සමීපතම රූපවාහිනී වැඩසටහන බවට පත්ව තිබෙන්නේ ටෙලි නාට්‍යයි. මේවායින් බහුතරය කලාත්මක බවින් හීන හරසුන් ඒවා බව විචාරකයෝ පවසති. එබැවින් ටෙලි නාට්‍ය අධ්‍යාපනික, සෞන්දර්යාත්මක හා ගුණාත්මක අරමුණු හා සමඟ සබැඳි විනෝදාස්වාදජනක මාධ්‍යයක් බවට පත් කිරීම කාලීන අවශ්‍යතාවකි.

(ලකුණු 25)

(ඊ) මහලු විය අද සමාජයේ ප්‍රබලම ගැටලුවක් වී හමාර ය. පවුල් සංස්ථාව තුළ හැදෙන වැඩෙන දරුවන්ගේ ආරක්ෂාව, දැනුම, දියුණුව උදෙසා කැප වන්නේ ද වැඩිහිටියන් ය. මහලු වියට පත්වූ පසු තම නිවෙස්වලම රඳවාගෙන ඇප උපස්ථාන කරමින් ඔවුන් රැක බලා ගැනීම දරුවන්ගේ යුතුකමකි. ඇප උපස්ථාන කරනවා වෙනුවට වර්තමාන සමාජයේ ඇතැම්හු වැඩිහිටි නිවාස වලට යොමු කරති. ඇතැම්හු මහ මඟ අසරණව කල් ගෙවති. මෙවැනි තතු ජනමාධ්‍යයෙන් ද නිතර පෙන්වනු ලබයි. බෞද්ධ රටක් වන ශ්‍රී ලංකාවට මෙය කෙතරම් ගැළපේ ද?

(ලකුණු 25)

(03) පහත දැක්වෙන ඡේදය වචන 50 - 55 අතර ගණනකින් යුක්ත වන සේ සාරාංශ කොට ලියන්න. ඔබේ සාරාංශයේ ඇතුළත් වචන ගණන උත්තරය අග ලියන්න.

වර්තමාන ලෝකයේ හැම රටකම පාහේ අවධානය සංවර්ධනය කෙරෙහි යොමු වී පවතී. පරිණාමය නමින් අප හඳුන්වන්නේ මේ සංවර්ධනය යි. එය යුගයෙන් යුගයට විවිධ ස්වරූප ගනිමින් නව ගොඩනැගිලි, කර්මාන්තශාලා ආදිය බිහි කරයි. ගහකොළ කැපී කෙටී යාම, සත්ත්ව ජීවිතයට ඇති ඉඩකඩ සීමාවීම එහි ලා ඇති වන දෘශ්‍යමාන ප්‍රතිඵලයි. දීර්ඝකාලීන සැලැස්මකින් තොරව සංවර්ධනයේ නාමයෙන් කෙරෙන පරිසර විනාශය සත්ත්ව වර්ගයාගේ විනාශයට දොර හැරීමකි. තාක්ෂණික දියුණුව උපයෝගී කරගනිමින් මිනිස් අවශ්‍යතා සපුරා ගැනීමට මං පෙත් විවෘත කර ගෙන ඇතත් ඒ බලවේග නිසා පරිසරයට වන හානිය වළක්වා ගැනීමට සිදු වී තිබීම අප ඉදිරියේ ඇති බලවත් අභියෝගයකි. ශාක පද්ධතිය නැති විට වාතය අපිරිසිදු වීමට ද ජල මට්ටම අඩු වීමට ද ඉඩ ඇත. මේ කරුණු කොටගෙන කෘෂිකර්මය හා සත්ව පාලනය මිහිපිටින් අහෝසි වීමට ද ඉඩ තිබේ. මෙසේ බලන විට සංවර්ධන කාර්යයේ දී අපේ දැඩි අවධානය යොමු විය යුත්තේ තාක්ෂණික බලවේග වලින් පරිසරය සුරැකීම කෙරෙහි බව පැහැදිලිය. ඵලදායීතාව වැඩිකර ගැනීමේ අදහසනි' දැන් දැන් බහුල ලෙස කෙරෙන කෘතිම පොහොර භාවිතය නිසා ජලය දූෂණය වී සත්ත්ව ජීවිතය හා ශාක ජීවිතය විනාශ වීමට ඉඩ ඇති බව මුළු ලෝකයාම පිළිගත යුතු කාරණයකි.

(ලකුණු 10)

(04) පහත දැක්වෙන ඡේදය කියවා ඒ සමඟ ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර සපයන්න.

සත්‍ය සිද්ධියක් නැතහොත් සත්‍ය ප්‍රවෘත්තියක් පදනම් කර ගෙන හෝ එසේ නැතහොත් සම්පූර්ණයෙන් කල්පිත ස්වරූපයෙන් හෝ නිර්මාණය කරනු ලබන හෙයින් නවකතාව, කෙටි නව කතාව, නව කතාව යන සාහිත්‍යාංග තුන ද ප්‍රබන්ධ කතා හෙවත් කල්පිත කතා ගණයට වැටේ. දීර්ඝ ඉතිහාසයක් ඇති මේ ප්‍රබන්ධ කතාව විකාශනය වීමෙන් පළමු ව නවකතාව ද ඉක්බිතිව නව කතාවේ ශාඛා දෙකක් වශයෙන් කෙටි කතාව හා කෙටි නව කතාව ද යන නව සාහිත්‍යාංග ඒවාටම විශේෂ වූ ශිල්පධර්ම සහිතව දියුණු වූයේ ය. කෙටි කතාව ආරම්භ වූයේ දහනව වන ශත වර්ෂයේ දී බව කියනු ලැබේ. අද ලෝකය පුරා ව්‍යාප්තව ජනප්‍රිය සාහිත්‍යාංගයක් බවට පත්ව ඇති කෙටි කතාව වස්තු විෂයය, කාර්ය සිද්ධිය, රචනා ධර්ම යනාදී අංග විසින් නවතම ක්ෂේත්‍ර ගවේෂණය කරමින් සිටිනු පෙනේ.

I) කෙටි කතාවේ ආරම්භය සිදු වූ බව සැලකෙන්නේ කවර ශතවර්ෂයේ දී ද?

II) නව කතා, කෙටි නවකතා හා කෙටි කතා යන සාහිත්‍යාංග ප්‍රබන්ධ කතා ලෙස සලකනු ලබන්නේ ඇයි?

III) මෙම ඡේදයේ මුඛ්‍යාර්ථය කුමක් ද?

IV) පහත සඳහන් පදවල අදහස ලියන්න.

(අ) කල්පිතයක් (ආ) විකාශනය

V) පහත දැක්වෙන පද විසන්ධි කරන්න.

(අ) සාහිත්‍යාංගය (ආ) යනාදී

(ලකුණු 2 ං 5 ූ 10)

(05) ඔබ ප්‍රදේශයට තවමත් විදුලි බලය ලබා නොදීම ප්‍රදේශයේ ජනයා මුහුණ දෙන අර්බුදයක් බවට පත්ව තිබේ. මේ නිසාවෙන් විවිධ ක්ෂේත්‍රයන්ට අදාළ බොහෝ දෙනා මුහුණ දෙන අපහසුතා රැසකි. ප්‍රදේශයේ ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් ප්‍රසන්න මධුරජිත් ඔබ යයි සිතා ප්‍රාදේශීය විදුලි ඉංජිනේරුතුමා වෙත යැවීමට සුදුසු රාජකාරී ලිපිය සකස් කරන්න. (වචන 125 පමණ සෑහේ)

නැතහොත්

පසුගිය දිනවල පැවති අධික වර්ෂාව හේතුවෙන් ඩෙංගු මදුරු උවදුර ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙමින් පවතී. ප්‍රදේශයේ මහජනතාව දැනුවත් කරමින් බෙදා හැරීම සඳහා සුදුසු අත් පත්‍රිකාවක් සකස් කරන්න. රෝගය වැළඳෙන ආකාරය, එය වළක්වා ගැනීමට ගතයුතු ක්‍රියාමාර්ග, රෝගයෙන් සිදුවන හානි, රෝගියා බේරා ගත යුතු නිවැරදි ආකාරය යන කරුණු අත් පත්‍රිකාවෙහි ඇතුළත් විය යුතුය. (වචන 125 පමණ සෑහේ)

(ලකුණු 15)